# දූෂණය හඳුනාගනිමු
# එරෙහිවෙමු
# පිටුදකිමු






සැකසුම: ඩී. එම්. දිසානායක

චිත්‍ර: එච්. කේ. සුජිත් කුමාර

**දූෂණ විරෝධී වැඩ සටහන - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශණයකි**

**සියළුම හිමිකම් ඇවිරිණි**

කතෘගේ අවසරය ඇතිව මෙම ප්‍රකාශනයෙහි
අඩංගු කරුණු උපයෝගී කර ගැනීමට අවසර ඇත

පළමු මුද්‍රණය 2006
දෙවන මුද්‍රණය 2007

**ISBN : 978-955-1655-03-7**

වැඩිදුර විස්තර සඳහා විමසන්න

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA)
24/2, 28 වන පටුගම
මල් පාර
කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකතන අංක : +94 11 2565304,2565306
ෆැක්ස් : +94 11 4714460
ඊ මේල් : cpa@sri.lanka.net
වෙබ් අඩවිය : www.cpalanka.org

# දූෂණය හඳුනාගනිමු
# එරෙහිවෙමු
# පිටුදකිමු

සැකසුම: ඩී. එම්. දිසානායක

චිත්‍ර: එච්. කේ. සුජිත් කුමාර

දූෂණ විරෝධී වැඩ සටහන - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශණයකි

| පටුන | පිටුව |
| --- | --- |
| දූෂණය කියන්නේ මොකක්ද? | 02 |
| දූෂණය කියන්නේ පගාව ගන්න එක විතරක් නෙමෙයි | 03 |
| දූෂණයේ විවිධ ස්වරූප | 05 |
| නිතර හමුවන දූෂණයන් සිදුවන අවස්ථාවන් | 06 |
| දූෂණය සිදුවන්නේ ඇයි ? | 07 |
| දූෂණය පාට වෙනස් කරන කටුස්සෙකි | 08 |
| දූෂණයේ ප්‍රතිවිපාක මොනවාද ? | 09 |
| දූෂණය මැඩලීමට ක්‍රමයක් තියෙනවද ? | 10 |
| එසේ නම් තවදුරටත් දූෂණය සිදුවන්නේ ඇයි ? | 18 |
| අපි දූෂණයට ඉඩ දී බලා සිටිමුද? | 19 |
| අපට කළහැකි දේ කුමක්ද? | 20 |
| ස්තූතිය | 27 |

## දුෂණය කියන්නේ මොකක්ද?

යම් පුද්ගලයකු තම තනතුර අනුව හෝ පොදු පිළිගැනීම මත තමන්ට හිමි වූ බලය යොදා ගනිමින් යම් පෞද්ගලික ලාභයක් හෝ වාසියක් සඳහා නීතියට හෝ සම්ප්‍රදායට විරුද්ධව කටයුතු කිරීම.


### දූෂණයේ මූලික ලක්ෂණ

i. නිලයෙන් හෝ පිළිගැනීමෙන් බලය හිමි පුද්ගලයකු සිටීම (රජයේ සේවකයෙක් )

ii. බලය ක්‍රියාවේ යෙදවීම

iii. පෞද්ගලික ලාභයක් ලැබීම (තමන්ට හෝ තම හිතවතෙකුට)

### දුෂණයේ පාර්ශව






# දූෂණය කියන්නේ පගාව ගන්න එක විතරක් නෙමෙයි


දූෂණය කියන්නේ නිල බලය අයුතු ලෙස යොදා ගෙන කරන වැරැදි ගොඩක එකතුවක්




අල්ලස
වංචාව
බලහත්කාරය
තීරණ ගැනීමේ අයිතිය වැරදි ලෙස යොදා ගැනීම
හිතමිත්‍ර සංග්‍රහ
ඥාති සංග්‍රහ
අසාධාරණ අය කිරීම්
ඇතුළත වෙළඳාම
පොදු දේපල අයථා පරිහරණය
නීති විරෝධී ප්‍රදාන

ආදි සියලු දේම දූෂණය කියන වචනය තුළට ඇතුලත්


අමාත්‍යාංශය
විනෝද චාරිකා පාසල් ගමන්



# දූෂණයේ විවිධ ස්වරූප

**වංචාව** - යම් නිලධාරියකු හෝ රජයේ සේවකයකු තමාගේ හෝ වෙනත් පුද්ගලයකුගේ ලාභ ප්‍රයෝජනය සඳහා තවත් පුද්ගලයකු රැවටීම හෝ උගුලකට හසු කිරීමට කටයුතු කිරීමයි. මෙහිදී රැවටීමට ලක්වන පුද්ගලයාට හෝ පොදු මහජනතාවට හෝ රජයට අලාභයක් හෝ හානියක් සිදු වේ.

**අල්ලස** - රජයේ සේවකයෙක් තමන්ගේ සේවය වෙනුවෙන් තමන්ට නීත්‍යානුකූලව හිමි වැටුප් හා දීමනා හැරුනුකොට තමාට නීතිමය හිමිකමක් නැති තුටුපඬුරක් (සන්තෝසමක්) ලබා ගැනීම සහ රජයේ සේවකයෙක් ලබා දුන් සේවය (විශේෂ සැලකිල්ල)වෙනුවෙන් තුටු පඬුරක් ලබා දීම යන කරුනු දෙකම මෙහිදී අදහස් වේ.

**අයුතු බලහත්කාරය** - යමක් කිරීමට හෝ නොකර සිටීමට මුදලින් හෝ වෙනත් වටිනා දෙයකින් හෝ සේවාවකින් ගෙවීමක් කරන ලෙසට පුද්ගලයකුට බලකර සිටීම මෙහිදී සිදු වේ. බලහත්කාරයට යටත් නොවී සිටීමෙන් තම කාර්යය ඉටු නොවීම පමණක් නොව සමහර විට ශාරීරික හානි වලට ලක්වීමට පවා සිදුවිය විය හැක.

**බලය අයුතු ලෙස යෙදවීම** - නීතියෙන් තමන්ට හිමි තීරණ ගැනීමේ බලය හෝ නීතිය ක්‍රියාත්මක කිරීමට ඇති බලය පාවිච්චි කරමින් එක් පිරිසකට හෝ පුද්ගලයකුට විශේෂ වාසි හිමි වන ආකාරයෙන් වැරදි සහ අසාධාරණ තීරණ ගැනීම හා නීති ක්‍රියාත්මක කිරීම. නීති වැරදි අයුරින් ක්‍රියාත්මක වීමත් යම් යම් තීරණ වල නිවැරදි හා සාධාරණ බව මැනීමේ ක්‍රියා පිළිවෙතක් නොතිබීමත් මෙම දේ සිදුවීමට හේතු වේ.

**ඇතුළත වෙළදාම** - තම නිලයේ කටයුතු, යුතුකම් හා වගකීම් සමග නොගැලපෙන ආකාරයෙන් වෙළඳ ලාභ අත් කර ගැනීම් හෝ ගණුදෙනු වල යෙදීමෙන් පුද්ගලික ධනය රැස්කර ගැනීමට කටයුතු කිරීමයි.

**අනුග්‍රහ දැක්වීම** - යම් පුද්ගලයකුගේ සේවය හෝ සම්පත් පවුල්, පක්ෂ, ජාති, ආගමික, කුල, ස්ත්‍රී, පුරුෂ හෝ වෙනත් කැමැත්තක් මත ලබාදීමයි.

**ඥාති සංග්‍රහ / මිත්‍ර සංග්‍රහ** - මහජන ආයතන සඳහා පත් කිරීම් හෝ නම් කිරීම් වල දී හෝ රජයේ යම් සහන ලබාදිම් වල දී ඥාති හිතවත්කම් මත එම පත් කිරීම් සිදු කිරීම හා සහන ලබා දීමයි.

**නීති විරෝධී ප්‍රදානයන්** - බලයේ සිටින දේශපාලන පක්ෂයට හෝ ආණ්ඩුවට යම් යම් තීරණ වලදි මැදිහත් නොවී සිටීම සඳහා හෝ විශේෂයෙන් මැදිහත් වීම සඳහා හෝ බලයට පැමිණීමට සිටින දේශපාලන පක්ෂවලට, දේශපාලඥයින් බලයට පැමිණි පසු ලබා දිය හැකි ලාභ සහ අනුග්‍රහයන් වෙනුවෙන් ලැබෙන අරමුදල් සහ ප්‍රදානයන් මින් අදහස් වේ.

# අපිට නිතර හමුවන දූෂණයන් සිදුවන අවස්ථා මොනවාද ?

➘ අලස වූ රාජ්‍ය සේවා කටයුතු ඉක්මන් කරගැනීම සඳහා ලබා දෙන අල්ලස්.




➘ ටෙන්ඩර් ක්‍රියාවලියේදී සිදුවන මහා පරිමාණ දූෂණයන්.

➘ දේශපාලන පත්වීම් ලබාදීමේදී සිදුවන ඥාති සංග්‍රහ හා මිත්‍ර සංග්‍රහ.

# දූෂණය සිදුවන්නේ ඇයි ?

## ආර්ථික හේතු

- ආදායම් බෙදීයාමේ විෂමතාව හා දිළිඳුකම.
- සහනාධාර කෙරෙහි ඇති තරඟය.
- අත්තනෝමතික පෞද්ගලීකරණය.
- විධිමත් ආර්ථික ප්‍රතිසංස්කරණ නොමැතිකම.

## දේශපාලන හේතු

- දේශපාලන ඒකාධිකාරය හා රාජ්‍ය ආයතන දේශපාලනීකරණය.
- නියෝජිතයා ජනතාවගෙන් ඈත් කරන ඡන්ද ක්‍රමය.
- අස්ථාවර දේශපාලන පරිසරය.
- යුද්ධය හා එහි ගණුදෙනුවල රහස්‍යභාවය.
- රජයේ විනිවිද භාවයෙන් හා වගවීමෙන් තොරබව.
- පටු දේශපාලන මතිමතාන්තර.
- මැතිවරණ ක්‍රමය තුළ ආයෝජනය කරන වියදම් ඉහල යාම.
- විධායක,ව්‍යවස්ථාදායක,අධිකරණ ආයතන අතර අසමබර සබඳතාවය.

## පරිපාලන හේතු

- නිලධාරින් සතු අසමමිතික බලතල
- රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු වල අකාර්යක්ෂම බව.
- උනන්දු කිරීම්, පෙළඹවීම් වලින් තොර රාජ්‍ය පරිපාලනය.
- ආයතනික දුර්වලතා
- නුසුදුස්සන් ඉහල තනතුරුවලට පත්වීම.
- බලය බෙදී නොයා තිබීම.

## නීතිමය හේතු

- පවතින නීතියේ අඩුපාඩු පැවතීම.
- නීතිය කෙරෙහි ජනතාවගේ විශ්වාසය බිඳවැටීම.
- නීතියේ බලය හා ගෞරුත්වය පිරිහීම.
- නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල දුර්වලතා.
- නීතිය ඉදිරියේ සියලුදෙනාට සමානව නොසැලකීම.

## සමාජීය හේතු

- මහජනතාවගේ නොදැනුවත්භාවය.
- මහජනතාව වෙත තොරතුරු ගලා නොයාම.
- නිසි ක්‍රම වේදයෙන් බැහැරවීමට ජනතාව දරන උත්සාහය.
- මුදල් මුල්කරගත් සමාජ ක්‍රමය.
- පුද්ගල හෘදය සාක්ෂියේ දුර්වලතා.
- සමාජ හා ආගමික නායකයින්ගේ සහාය ප්‍රමාණවත් නොවීම

# දූෂණය පාට වෙනස් කරන කටුස්සෙකි



එයට අවස්ථාවෙන් අවස්ථාවට විවිධ
මුහුණුවර තිබේ



විශාල වටිනාකම් වලින් මෙන්ම සුළු වටිනාකම් වලින්ද
දූෂණය සිදුවිය හැකිය.

පහල ශ්‍රේණිවල නිලධාරීන් අතර මෙන්ම විධායක
නිලධාරීන් අතරද දූෂණය සිදුවිය හැකිය.



බැලූ බැල්මට නීතපානුකූල ලෙස දූෂණයට
පෙනී සිටිය හැකිය.



දූෂනය සමාජයට අවශප දෙයක් ලෙසද
පෙනීසිටිය හැක.

දූෂණයේ ස්වභාවය කුමක් වුවත් කුමන ආකාරයකින්
පෙනී සිටියත් එය සමාජයට බරපතල හානි සිදු කරයි.

# දූෂණයේ ප්‍රතිවිපාක මොනවාද

- රජයේ සේවා සැපයීම බිඳ වැටේ.
- රජයේ ආයතනවල විනය, ක්‍රියාකාරීත්වය පිරිහීමට ලක්වේ.
- ස්වාධීන රාජ්‍ය සේවය විනාශ වේ.
- යහපත් රාජ්‍ය පාලනය බිඳ වැටේ.
- රට ආර්ථික වශයෙන් පරිහානියටත් දැඩි දුප්පත් කමටත් ගොදුරු වේ.
- භාණ්ඩ මිල ඉහළ යයි.
- නීතිය හා සමාජ සැබැඳියාව බිඳ වැටේ.
- මානව හිමිකම් හෑල්ලුවට ලක්වේ.
- සමාජ අසාධාරණය ඇති කරයි.
- ජනතාවගේ මූලික අවශ්‍යතා සැපයීමට පවා රජයට නොහැකි වේ.
- විදේශ ආයෝජන ගලා ඒම නතර වේ.
- අපරාධ වර්ධනය වේ.
- දැඩි සමාජ, ආර්ථික, දේශපාලන අර්බුද ඇති කරයි.






# දූෂණය මැඩලීමට ක්‍රමයක් තිබේද?

**ශ්‍රී ලංකා රජය දූෂණ වැළැක්වීමට සහ රජයේ විනිවිද බව ආරක්ෂා කිරීමට විවිධ පියවර ගෙන ඇත.**

**( විවිධ දූෂණ වැළැක්වීමට විවිධ ක්‍රමවේදයන් ඇති ආයතන සහ නීති සකසා ඇත. )**

- විගණකාධිපති දෙපාර්තමේන්තුව
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
- ජාතික පොලිස් කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
- ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව
- ඔම්බුඩ්ස්මන් වරයා
- අධිකරණය
- ආයතන සංග්‍රහය
- මූල්‍ය රෙගුලාසි



# විගණකාධිපති



- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිහිටුවා ඇති ආයතනයකි.
- විගණකාධිපති පත් කිරීම ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අනුමැතිය මත ජනාධිපතිවරයා විසින් සිදු කරයි.
- ජාතික මට්ටමේ, පළාත් මට්ටමේ හා ප්‍රාදේශිය මට්ටමේ ඇති රජයේ ආයතන වල කටයුතු විගණනය කිරීම සිදු කරයි.
- විගණනයෙන් පසු වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.
- පාර්ලිමේන්තුවේ මහජන ගිණුම් කාරක සභාව සහ රාජ්‍ය ව්‍යවසාය කාරක සභාව විසින් විගණකාධිපතිගේ වාර්තා සලකා බලමින් චෝදනා ලබන රාජ්‍ය නිළධාරීන් ප්‍රශ්න කිරීම සිදුකරයි.
- පළාත් පාලන ආයතන හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දූෂණ සම්බන්ධයෙන් අධිභාර පැනවීමේ බලය ඇත.



- ප්‍රාදේශිය කාර්යාල ඇත.
- අර්ධ රාජ්‍ය ආයතන හා සමුපකාර විගණනය නොකරයි.

රාජ්‍ය ආයතනවල සිදුවන මූල්‍ය දූෂණ හා අක්‍රමිකතාවන් පිලිබඳව සෘජුව විගණකාධිපතිට දැන්වීමේ ඉඩ කඩ මහජනතාවට ඇත.

එකී පැමිණිලි විමර්ශනය කිරීමේදී පැමිණිලි කළ පුද්ගලයින්ට පාර්ශවයක් වීමට සිදු නොවේ.
මහජන පැමිණිලි පහත ආකාර වලින් ඉදිරිපත් කළ හැකිය.

ලිපිනය: ජී. ඒ. ජේමතිලක ,විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

දුරකථන: 011 2685167
ඊ-මේල්: oaggov@sltnet.lk
වැඩිදුර විස්තර සඳහා වෙබ් අඩවිය:
www.auditorgeneral.lk

# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව



- 1954 අල්ලස් පනත මගින් ස්ථාපිත කර තිබූ අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා අල්ලස් කොමසාරිස් තනතුර අවලංගුකර,
- 1994 අංක 19 දරණ අල්ලස් (සංශෝධන) පනත මගින් අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීය.
- කොමිෂන් සභාව කොමසාරිස් වරුන් තුන් දෙනෙකුගෙන් සමන්විතය.
- රජයේ සේවකයින්ට එරෙහිව එල්ලවන අල්ලස් හෝ දූෂණ චෝදනා සහ අයථා ආකාරයෙන් වත්කම් ඉපයීම් පිලිබඳව විමර්ශන කටයුතු සිදුකර නීතිය ඉදිරියට ගෙන එම ප්‍රධාන කාර්යභාරය වේ.

***<u>කොමිෂන් සභාව සතු සුවිශේෂ බලතල කීපයකි</u>***

ඉහත වැරදි සිදු කරන රජයේ සේවකයින්ට හා අල්ලස් දෙන්නන්ට එරෙහිව චෝදනා එල්ල කිරීමට,
ඔවුන්ට විරුද්ධව ඇති චෝදනා පරීක්ෂා කිරීමට,
චෝදනා තහවුරු වේ නම් ඔවුන්ව අධිකරණය ඉදිරියට ගෙන යාමට හා අධිචෝදනා ගොනුකිරීමට,
පරීක්ෂණ අවසන් වනතුරු විදේශ ගමන් බලපත්‍ර මාස තුනක් දක්වා අත් හිටුවීමට,
දේපල හිමිකම් මාරුකර ලියාපදිංචිය වැලැක්වීමට කොමිෂන් සභාවට බලතල ඇත.



- රජයේ සේවකයින් විසින් සිදු කරනු ලබන අල්ලස් ඉල්ලීම් අල්ලස් ලබාගැනීම් රාජ්‍ය දේපල හා නිලයන් අයථා පරිහරණය කිරීම් සහ රජයේ සේවකයින් අයතා ආකාරයෙන් වත්කම් ඉපයීම් පිලිබදව අල්ලස් කොමිෂන් සභාවට සෘජුව පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.
- අල්ලස් ලබාගැනීමක් පිලිබදව විමර්ශනයක් ආරම්භ කිරීම සඳහා ලිඛිත පැමිණිල්ලක් තිබීම පනත අනුව අත්‍යාවශ්‍ය වේ.
- තොරතුරු ලබාදෙන්නන්ගේ රහස්‍ය බව සුරැකීමට එම ආයතනයේ නිළධාරීන් බැඳීසිටී.
- දුරකතනයෙන් වුවද තොරතුරු ලබාදිය හැකි වුවද පසුව ලිඛිත පැමිණිල්ලක් ලබාදීම අත්‍යාවශ්‍ය වේ.

මහජන පැමිණිලි පහත ආකාර වලින් ඉදිරිපත් කළ හැකිය.
ලිපිනය: සභාපති
අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව,
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.
ඊ-මේල්: sccy@sltnet.lk , ciaboc@eureka.lk

දුරකථන: විනිසුරු අමීර් ඉස්මයිල් (සභාපති) -011 2596359
පියසේන රණසිංහ මහතා ( අධ්‍යක්ෂක)-011 2586851
නෙවිල් ගුරුගේ මහතා (විමර්ශන අධ්‍යක්ෂ ජනරාල්)-011 2586841
පැමිණිලි සඳහා ක්ෂණික දුරකථන අංකය - 1954
වැඩිදුර විස්තර සඳහා වෙබ් අඩවිය: www.ciaboc.gov.lk

# ජාතික පොලිස් කෙමිෂන් සභාව



- 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත ආයතනයකි.
- දේශපාලන බලපෑම් වලින් තොරව පොලීසිය පවත්වාගෙන යාම මුලික අරමුණයි.
- පොලස් නිලධාරීන් මාරුකිරීම්, උසස්කිරීම්, විනය පරීක්ෂණ දේශපාලන බලපෑම්වලින් තොරව සිදුකිරීමට ඉඩ සැලසේ.
- පොලීසියට එරෙහිව එල්ල වන චෝදනා සලකා බැලීමට බලය ඇත.
- පොලිස් නිලධාරීන්ට අවංකව සහ ස්වාධීනව කටයුතු කිරීමට ඉඩකඩ සැලසේ.
- ඒ තුලින් පොලීසියට දේශපාලඥයින් හා රජයේ සේවකයින් සිදුකරන පොදු දේපලවලට එරෙහි අපරාධ, පොදු අරමුදල් අව භාවිතය, රාජ්‍ය සම්පත් වැරදි ලෙස පරිහරණය ආදී පරීක්ෂණ සිදු කිරීමට ඇති ඉඩකඩ පුළුල් වී ඇත.
- පොලිස් නිලධාරීන්ට විරුද්ධව ඉදිරිපත්වන චෝදනා විමර්ශනය කර වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමට හැකියාව ඇත.



මහජන පැමිණිලි පහත ආකාර වලින් ඉදිරිපත් කළ හැකිය.

ලිපිනය: සභාපති,

ජාතික පොලිස් කොමිෂන් සභාව,

3 වන මහල,

රොටුන්ඩා ගොඩනැගිල්ල,

අංක 109, ගාලු පාර,

කොළඹ 03.

දුරකථන: 011 2395310

ඊ-මේල්: polcom@sltnet.lk

වැඩිදුර විස්තර සඳහා වෙබ් අඩවිය: www.npc.gov.lk

# ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව



- 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කිරීමට අනුමත කර ඇතත් ව්‍යවස්ථාදායක සභාව විසින් අවශ්‍ය පත්කිරීම් තවම සිදුකර නැත.
- නිදහස් හා සාධාරණ මැතිවරණයක් තහවුරු කිරීම මූලික අරමුණය.
- මැතිවරණ අයථා ක්‍රියා හා දූෂණ මර්ධනය කිරීමේ බලතල එහි සතුවේ.
  - දේශපාලන කටයුතු වලට පොදු දේපල යොදා ගැනීම වැලැක්වීම
  - නිදහස් හා සාධාරණ මැතිවරණයක් උදෙසා මාධ්‍ය ආයතන වලට මාර්ගෝපදේශ ලබාදීම
  - මැතිවරණ වලදී සාධාරණ ලෙස රාජ්‍ය මාධ්‍ය යෙදවීම
  - සාධාරණ මැතිවරණයක් සඳහා පොලීසිය හා ආරක්ෂක අංශ සේවයේ යෙදවීම
  - මැතිවරණ වලදී රාජ්‍ය නිලධාරීන් මෙහෙය වීම යන බලතල සතුය.



# රාජ්‍ය සේවා කොමිෂන් සභාව

- 17වන ආණ්ඩුක්‍රම සංශෝධනය මගින් ස්ථාපිත ආයතනයකි.
- රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීම මූලික අරමුණය.
- රාජ්‍ය සේවයේ පත් කිරීම්, උසස් කිරීම් හා විනය පාලනය සම්බන්ධ බලතල මෙය සතුය.
- රාජ්‍ය සේවකයන්ගේ විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය ඇත.
- දූෂණයේ වරද මත රැකියාව අහිමි කිරීමේ බලය පවා හිමිය.
- පළාත් රාජ්‍ය සේවා කොමිසම් ඒ ඒ පළාත් මට්ටමින් රජයේ නිලධාරීන්ගේ විනය විරෝධී ක්‍රියා පිළිබඳ ක්‍රියාකරනු ඇත.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව



- 1996 අංක 21 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කොට ඇත.
- කොමිසමේ කොමසාරිස්වරු ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් පත්කරනු ලබයි.
- මානව හිමිකම් සහ නීතියේ බලය තහවුරු කිරීම මූලික අරමුණ වේ.

***මේ සඳහා ආයතනයට සතු සුවිශේෂ බලතල රාශියක් ඇත.***

පුද්ගලයකු රඳවාගෙන සිටින ස්ථාන පරීක්ෂා කිරීමට හා රඳවාගෙන සිටින ස්ථාන වැඩි දියුණුකිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම මූලික අයිතිවාසිකම් වලට ගරුකිරීම, පිලිපැදීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පරිපාලන පිලිවෙත් හා කාර්ය පටිපාටි පිලිබද සුපරීක්ෂාකාරී වීම, මූලික අයිතිවාසිකම් උල්ලංගනය වීම් හා උල්ලංඝණය වීමට ආසන්න තත්වයන් පිළිබද පැමිණිලි භාර ගැනීම, විමර්ශන කිරීම, සමත කිරීම හෝ නිර්දේශ කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කෙ සභාව වත යොමුකරන කරුණු සම්බන්ධයෙන් අදාල විමර්ශන හා විභාග පැවැත්වීම ඒ අතරින් වැදගත් වේ.

ඒ සඳහා රාජ්‍ය නිළධාරීන් හා රාජ්‍ය ලේඛන විමර්ශනය සඳහා කැඳවීමට බලය ඇත.



***ප්‍රධාන කාර්යාලයට හෝ ප්‍රාදේශිය කාර්යාලයකට පැමිණ ලිඛිතවද නැතහොත් ලිපි මගින් දුරකථන මගින් හෝ ෆැක්ස් මගින් ද පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. ඒ සඳහා නීතිඥ සහාය අවශ්‍ය නොවේ.***

මහජන පැමිණිලි පහත ආකාර වලින් ඉදිරිපත් කළ හැකිය.

ලිපිනය: අධ්‍යක්ෂක (විමර්ශණ),
මානව හිමිකම් කොමිෂන් සභාව,
අංක 36, කින්සි පාර,
කොළඹ 8.

දුරකථන: ක්ෂණික ඇමතුම් 011 2689064

ෆැක්ස්: ලේකම් 011 2694924

ඊ-මේල්: sechrc@sltnet.lk

වැඩිදුර විස්තර සඳහා වෙබ් අඩවිය: www.hrcsl.org

ප්‍රාදේශීය කාර්යාල පහත සදහන් දිස්ත්‍රික්ක වල පිහිටා ඇත. නුවර, මාතර, මඩකලපුව, අනුරාධපුර, ත්‍රිකුණාමලය, වවුනියාව, බදුල්ල, අම්පාර, කල්මුනේ සහ යාපනය www.hrcsl.org

# ඔම්බුඩ්ස්මන්

(පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් )



- ජනාධිපති වරයා විසින් පත් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ස්ථාපිත ආයතනයකි.
- රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, ව්‍යවස්ථා මණ්ඩලය, සංස්ථා, රජයේ අධිකාරයන් හා වෙනත් පළාත් පාලන ආයතනවල රජයේ සේවකයින්ට විරුද්ධව කෙරෙන පැමිණිලි විමර්ශනය කරයි.
- රාජ්‍ය නිළධාරීන් සිදු කරන මූලික අයිතිවාසිකම් කඩකිරීම් වෙනත් අසාධාරණයන් හෝ රාජ්‍ය ආයතන වල අකාර්යක්ෂමතාවයන් පිලිබදව පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.



- 1995න් පසුව පුද්ගලයකුට තම ඉල්ලීම සෘජුව ඔම්බුඩ්ස්මන් වරයාට ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබී ඇත.
- ඔම්බුඩ්ස්මන් වරයාගේ අදාල විමර්ශන වලින් පසුව අසාධාරණයක් වී ඇත්නම් ඊට සුදුසු සහන නිර්දේශ කරණු ඇත.
- එකී නිර්දේශ ක්‍රියාත්මක නොකලොත් අදාල නිර්දේශ හා වාර්ථාවල පිටපත් ජනාධිපති වරයාට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.
- එක් ජාතික ඔම්බුඩ්ස්මන් වරයකු හා කාර්ය මණ්ඩලයක් සිටින අතර පොලීසිය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට පමණක් දෙපාර්තමේන්තු ඔම්බුඩ්ස්මන් වරයකු හා කාර්ය මණ්ඩලයක් සිටී.

මහජන පැමිණිලි පහත ආකාර වලින් ඉදිරිපත් කළ හැකිය.

ලිපිනය: ඔම්බුඩ්ස්මන්
නො 06,
එලි බැන්ක් පාර,
කොළඹ 05,

දුරකථන: 011 2588798
011 2588982

# අධිකරණය



- අධිකරණයට ආකාර දෙකකින් දූෂණය පාලනය කිරීමට හැකියාව ඇත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන පරිච්ඡේදයේ සඳහන් මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපාදන මගින් රාජ්‍ය සේවය තුළ බඳවා ගැනීම්, උසස්වීම් ලබාදීම් හා සේවයෙන් ඉවත් කිරීම් ආදී අවස්ථාවලදී දූෂණ අවම කිරීමට ක්‍රියා කළ හැකිය.
- අපරාධ නීතිය යටතේ රාජ්‍ය අංශයේ සිදුවන අල්ලස් ඉල්ලීම, ගැනීම හා දීම සහ පොදු දේපල අයථා පරිහරණය ආදී වැරදි වලට එරෙහිව සහ රාජ්‍ය අංශයට පමණක් සීමා නොවන වංචාව සාපරාධී විශ්වාසය කඩකිරීම ආදී වැරදි වලට එරෙහිව චෝදනා විභාග කොට දඬුවම් ලබාදීම මගින් දූෂණ අවම කිරීමට ක්‍රියා කළ හැකිය.
- මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට දිවුරුම් ප්‍රකාශ මාර්ගයෙන් හෝ සෘජුව අග්‍ර විනිශ්චකාර වරයාට ලිවීමෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.



# ආයතන සංග්‍රහය

- රජයේ මානව සම්පත නිසි පරිදි හැසිරවීම මූලික අරමුණය.
- රාජ්‍ය සේවයේ පත්කිරීම්, උසස්කිරීම්, මාරු කිරීම් හා විනය පරීක්ෂණ සම්බන්ධයෙන් අවශ්‍ය නීති ඇතුළත් කර ඇත.
- රජයේ නිළධාරීන් බලය අයුතු ලෙස යෙදවීම පාලනය ද සිදුවේ.
- දූෂිත නිළධාරීන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට ඉඩකඩ සැලසේ.

# මූල්‍ය රෙගුලාසි

- රජයේ මුදල් හා අනෙකුත් දේපල නිසිපරිදි යෙදවීමට අදාල නීති ඇතුළත්ය.
- රජයේ මිලදී ගැනීම් රාජ්‍ය නිළධාරීන්ගේ වියදම් රජයේ මුදල් වෙන් කිරීම් පිළිබඳ නීති ඇතුළත්ය.
- රජයේ මුදල් දූෂිත ලෙස යෙදවීම වැළැක්වීමට ප්‍රතිපාදන ඇත.

# එසේ නම් තවදුරටත් දූෂණය සිදුවන්නේ ඇයි ?

- ජාතික අවංකත්වයේ බල කණු දුර්වල වීම.
- ජනතාවගේ නොදැනුවත්කම.
- දූෂණයට විරුද්ධව ක්‍රියාකිරීමට ජනතාව ඉදිරිපත් නොවීම.
- දූෂණයට එරෙහි මාධ්‍ය භාවිතයේ අඩුබව.
- දූෂණයට විරුද්ධව ක්‍රියාකිරීමට ජනතා සංවිධාන ඉදිරිපත් නොවීම.
- උසස් නිළධාරීන් තම ආයතනවල සිදුවන දූෂණ බරපතල ප්‍රශ්නයක් යයි නොසිතීම.
- දූෂණය වැලැක්වීමට ඇති රාජ්‍ය ආයතනවල ඇති මන්දගාමී ක්‍රියාකාරීත්වය.
- නීති පද්ධතියේ ඇති දුර්වලතා.
- දේශපාලන බලපෑම්.
- ජනතා ආකල්ප.



# අපි දුෂණයට ඉඩ දී බලා සිටිමුද ?

- දුෂණය මැඩ පැවැත්වීම රජයේ හා සියලුම ජනතාවගේ පරම යුතුකමක් හා වගකීමක් වන්නේය
- දුෂණයට එරෙහිවීමට සෑම පුරවැසියෙකුටම අයිතිවාසිකමක් ඇත
- දුෂණයට ඉඩ දීම යනු අපි විසින් බලය දුන් පිරිසට අපේම දේවල් වංචා කිරීමට / විනාශ  කිරීමට ඉඩ දීමකි



# අපට කළහැකි දේ කුමක්ද?



## පක්ෂය පාට කුමක් වුවත්

දූෂිත හා දූෂණයට උදවු දෙන දේශපාලකයින් බලයට පත් කිරීමෙන් වලකිමු.

# දූෂණය දුටු තැන ඊට එරෙහි වෙමු,

ඊට එරෙහිව පැමිණිලි කළ හැකි ආයතන වලට පැමිණිලි කරමු.



අපි අපේ සේවාව වෙනුවෙන් ලැබෙන වැටුප් හා දීමනා හැර වෙනත්

තුටු පඩුරු ඉල්ලීමෙන් හා ගැනීමෙන් වළකිමු.

අපි අපේ සේවා ආයතනයේ සම්පත් මහජන සේවය උදෙසා මිස

පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා නොගනිමු.

දූෂණය පිටු දැකීම අපි

නිවස තුළින් අරඹමු.

අපි මෙන්ම අපේ **අසල්වැසියන්ද**



**දූෂණයට එරෙහිව දැනුවත් කරමු.**



රජයේ කටයුතු පිලිබඳ
තොරතුරු ලබා ගැනීමත්,
රජයේ
වැරදි වලට එරෙහිවීමත්
අයිතියක් ලෙස සිතමු.

පටු දේශපාලන මත වලින් මිදී
රටේ සංවර්ධනය උදෙසා එක්ව
කටයුතු කරමු.



"පොදු දේපල සුරක්ෂිතව ආරක්ෂා කිරීමද පොදු දේපල අයතා ප්‍රයෝජනයට ගැනීම හා නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීමද ශ්‍රී ලංකා වාසී සෑම තැනැත්තෙකුගේම යුතුකම වන්නේය"

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන

# වැදගත් ලිපින හා දුරකථන අංක කීපයක්

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**
1වන මහල,
සතොස මහ ලේකම් කාර්යාලය,
තැ පෙ 1581,
අංක 27 වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
ටෙලි: 011 2393495, 2393577

**රාජ්‍ය සේවා කොමිශන් සභාව**
අංක 46, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
ටෙලි: 011 2314014, 2314570
ෆැක්ස්: 011 2314092

**නීති ආධාර කොමිසම**
129, මහාධිකරණ සංකීර්ණය
කොළඹ 12.
ටෙලි: 011 2433618

**රාජ්‍ය පරිපාලන හා අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය**
විමර්ශන කමිටුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
ටෙලි: 011 2667277, 2667373, 2667100

## තොරතුරු ලබාගත් මූලාශ්‍ර

www.transparency.org
www.gov.lk
Global Programme Against Corruption - Centre for International Crime Prevention
දණ්ඩ නීති සංග්‍රහය
ජාතික පරිපූර්ණතා පද්ධති වාර්තාව 2003 - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටරනැෂනල් ශ්‍රී ලංකා

<u>ස්තුතිය</u>

සාමාන්‍ය ජනතාවට සරල ලෙස දූෂණය පිලිබඳ කරුණු දැන ගැනීමට උපකාරීවන මෙවැනි පොතක් සකස් කිරීමට මූලික අදහසක් ලබා දුන් ලයනල් ගුරුගේ මහතාට, පොතෙහි අන්තර්ගතය කියවා වැරදි නිවැරදි කරදුන් අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් පියසේන රණසිංහ මහතාට, පොතට ඇතුලත් කිරීමට වැදගත් කරුණු දුරකථන අංකයන් සහ ලිපිනයන් ලබාදුන් ARD ආයතනයේ මිනාරි ප්‍රනාන්දු මහත්මියට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජගත් ලියන ආරච්චි මහතාට, මෙහි දෙමල පරිවර්ථනය සකස් කළ එම් එච් එම් අජ්මීර් මහතාට, සෝදුපත් කියවූ ශ්‍රියානි විජේසුන්දර මහත්මියට, මුද්‍රණය සඳහා මුදල් ආධාර ලබා දුන් USAID/ARD ආයතනයට මෙම පොත අලංකාර ලෙස මුද්‍රණය කළ එරෙක්ස් ගැෆික්ස් ආයතනයේ සියළු දෙනාට සහ නන්අයුරින් අපව දිරිමත් කළ සියළුම දෙනාට

අපේ හෘදයාංගම ස්තුතිය මෙසේ ප්‍රකාශකර සිටිමු.

Arex Graphics: 0773-085482